
# අරුණළු ජනතා පෙරමුණ

ඔබට හෙටක් - රටට සෙතක්

# ප්‍රතිපත්ති ප්‍රකාශය

# හා

# ව්‍යවස්ථාව



සිරිලක දේ - සිරි සැප දේ

අභිමානවත් දේශයක් උදෙසා

## අරුණලු ජනතා පෙරමුණේ ව්‍යවස්ථාව

| | | | |
|---|---|---|---|
| 01. | පක්ෂයේ නම | :- | අරුණලු ජනතා පෙරමුණ |
| 02. | ලිපිනය | :- | අංක 547, කටුපැලැල්ල, වැල්ලම්පිටිය |
| 03. | පක්ෂයේ ලාංජනය | :- | කිරි ඉතිරෙන කලය |
| 04. | පක්ෂයේ වර්ණය | :- | තැඹිලි වර්ණය |
| 05 | සංවිධාන ව්‍යුහය | :- | මුළු දිවයිනටම ආවරණය වන පරිදි |

### පක්ෂයේ නිළධාරි මඩුල්ල

| | | |
|---|---|---|
| 5.1 | ගරු පක්ෂ නායක හා මහ ලේකම් | |
| 5.2 | ගරු සභාපති | |
| 5.3 | ගරු ජාතික ලේකම් සහ ජාතික සංවිධායක | |
| 5.4 | ගරු භාණ්ඩාගාරික | |
| 5.5 | උප සභාපතිවරු | 02 |
| 5.6 | උප ලේකම්වරු | 02 |
| 5.7 | පළාත් නායකවරු | 09 |
| 5.8 | දිස්ත්‍රික් නායකවරු | 24 |
| 5.9 | ආසන සංවිධායකවරු | 160 |
| 5.10 | පාලන ලේකම් | |
| 5.11 | ජ්‍යේෂ්ඨ උප සභාපති | |
| 5.12 | ප්‍රාදේශිය නායකයන් | 368 |

### පක්ෂයට අනුබද්ධිත සංවිධාන

6.1 පැවිදි සංවිධාන
6.2 කාන්තා සංවිධාන
6.3 තරුණ සංවිධාන
6.4 ශිෂ්‍ය සංවිධාන
6.5 වෙලඳ සංවිධාන
6.6 ගුරු සංවිධාන
6.7 නීතිඥ සංවිධාන
6.8 සෞඛ්‍ය සේවා සංවිධාන
6.9 කම්කරු සංවිධාන
6.10 වෘත්ති සමිති සංවිධාන
6.11 ධීවර සංවිධාන
6.12 ගොවි සංවිධාන
6.13 ශාඛා සමිති, ලේකම්, භාණ්ඩාගාරික, සභාපති, කාරක සභිකයා
6.14 මධ්‍යම කාරක සභාව
6.15 සමස්ථ ලංකා කාරක සභාව
6.16 දේශපාලන මණ්ඩලය

ඉහත සඳහන් නිළධාරින් හා සංවිධාන ජාලය ඔස්සේ පක්ෂයේ සංවිධාන ව්‍යුහය ක්‍රියාත්මක වේ. එම සංවිධාන වලට හා තනතුරු සඳහා ඇති බලතල ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පහත දැක්වේ.

**පක්ෂයේ නායක මහලේකම්**

7.5.1 පක්ෂයේ නායක හා මහ ලේකම් තනතුරු දෙකම එක් පුද්ගලයෙකු දරණ අතර පක්ෂයේ නායකයා යාවජීව සාමාජිකයෙක් වේ. පක්ෂයේ මහ ලේකම් හා නායකත්වය හා සියළුම ලිපිලේඛන වලට අත්සන් තැබීම ඔහු සතු කාර්‍යභාරය හා වගකීම වේ.

7.5.2 පක්ෂයේ සියළුම නිළධාරින් ඔහුට අවනත විය යුතු අතර, පක්ෂයේ තීර්ණ ගැනීම හා ඉදිරි ගමන් ගම පිළිබඳ ගන්නා තීරණය ඔහු විසින් ගන්නා ලද තීරණ හා නිර්යාතය වේ.

7.5.3 ඔහුගේ අනුමැතියෙන් තොරව කිසිදු රැස්වීමක් පැවැත්වීම, පක්ෂය සම්බන්ධ කිසිදු කටයුත්තක් සංවිධාන කිරීම, ව්‍යවස්ථාපිතව නීතිගත කර ඇති අතර, පක්ෂයේ සියළුම වගකීම තීරණ ගැනීසේ බලතල, ඔහු සතු නිශේද බලය ලෙස ව්‍යවස්ථාපිතව නීතිගත වී ඇත.

7.5.4 පක්ෂය විසින් යම් කිසි මැතිවරණයකට ඉදිරිපත් වන අපේක්ෂකයන් සඳහා නාම යෝජනා මණ්ඩලයේ නායකා වශයෙන් කටයුතු කරන අතර, නාම යෝජනා ලබා දීම සහ නාම යෝජනාවට අත්සන් තැබීම ඔහු සතු කාර්ය භාරය වගකීම වේ.

7.5.5 පක්ෂය විසින් දැනට පවතින මැතිවරණ ක්‍රමයට අනුව ජයග්‍රහණය කරන මනාප ජන්ද පිළිබඳව පක්ෂය තීන්දුවක් නොගන්නා අතර, පක්ෂයේ ලාංනයට වැටෙන ජන්ද අනුව එක් එක් දිස්ත්‍රික්ක සඳහා පත්වන මන්ත්‍රීවරුන් තෝරා පත් කරනු ලබන්නේ පක්ෂයේ විධායක සභාව විසින්ය. විධායක සභාව විසින් ගන්නා තීරණය අවසන් තීරණය වන අතර, එයට අභියෝග කිරීමට කිසිවෙකුට නොහැක.

**ගරු සභාපති**

8.5.1 පක්ෂයේ රැස්වීම් වල මුලසුන දැරීම සහ පක්ෂයේ ක්‍රියාකාරීන් සමඟ අන්‍යෝන්‍ය භාවයෙන් කටයුතු කිරීම හා ශාඛා සමිති නිළධාරින් සමඟ සම්බන්ධ වී කටයුතු කළ යුතු අතර විධායක සභාව විසින් ගන්නා ලද තීන්දු තීරණ ශාඛා සභාපතිවරු සමඟ සම්බන්ධ වී පක්ෂයේ අනාගත උන්නතිය සඳහා ඉහමත් කැපවීමෙන් කටයුතු කළ අතර, පක්ෂය විසින් ගන්නා තීන්දු නීර්යාත අනුව ක්‍රියාකල කළ යුතු වේ.

**ගරු ජාතික සංවිධායක හා ජාතික ලේකම්**

9.5.1 මෙම තනතුරු දරන්නා පක්ෂ සංවිධානයේ නියමුවා ලෙස දක්වන අතර, දිස්ත්‍රික් සංවිධායකවරු පළාත් සංවිධායකවරු ආසන සංවිධායකවරු ඔහුගේ යටතේ කටයුතු කළ අතර, පක්ෂ සංවිධාන කටයුතු හා මැතිවරණ කටයුතු මෙහෙයවීම ඔහුගේ වගකීම හා කාර්‍ය භාර්ය වේ.

9.5.2 පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශකයා වශයෙන් ද කටයුතු කරන අතර, සියළුම සංවිධායකවරු ඔහුගේ යටතේ ඔහු විසින් දෙන උපදෙස් නිසියාකාරව ඉටු කිරීමට බැඳී සිටිය යුතු වේ. යම් සංවිධාවකවරුන් පක්ෂයේ ව්‍යවස්ථාවට හා ප්‍රතිපත්ති වලට කටයුතු කළ තිබුව හොත් ජාතික සංවිධායකවරයා විසින් පත් කරන ලද විනය කාරක සභාව බලතල ජාතික සංවිධායක සතුව පවති.

**ගරු භාණ්ඩාගාරික**

10.5.1 පක්ෂයේ විසින් පවත්වාගෙන යන ගිණුම් හා වියදම් පිළිබඳ බලධාරියා ද වන්නේය. ගිණුම් පොත් පවත්වාගෙන යාම, වාර්ෂික ගිණුම් අයවැය ඉදිරිපත් කිරීම, බැංකු පොත් පත් පරිපාලනය කිරීම, මුදල් පරිපාලනය, සියළුම වවුචර් වලට අත්සන් තැබීම, ඔහු සතු වගකීම හා කාර්ය භාර්ය වේ.

**ගරු උප සභාපතිවරු**

11.5.1 උප සභාපතිවරු දෙදෙනා පක්ෂයේ සභාපති විසින් දෙන තීන්දු තීරණ ක්‍රියාත්මක කළ යුතු අතර, ඔහු විසින් දෙන උපදෙස් පරිදි පක්ෂයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කළ යුතු වේ.

**ගරු පළාත් සංවිධායකවරු**

12.5.1 පක්ෂයේ සංවිධාන කටයුතු පළාත් මට්ටමින් සංවිධානය කිරීම ඔවුන්ගේ වගකීම වේ. ජාතික සංවිධායක විසින් දෙන තීන්දු ක්‍රියාත්මක කිරීමට ඔවුන් බැඳී සිටිය යුතු අතර, දිස්ත්‍රික් නායකවරුන් සමඟ පක්ෂයේ සංවිධාන කටයුතු ඉදිරියට ගෙන යාම වගකීම ඔහු සතුව ඇති විශේෂ වගකීමකි.

**ගරු දිස්ත්‍රික් සංවිධායකවරු**

13.5.1 තමන්ට හිමි දිස්ත්‍රික්කයේ ආසන සංවිධායකවරු සමඟ සංවිධාන කටයුතු කිරීම ඔවුන්ට පැවරී ඇති වගකීම වේ. මසකට වරක් සියළුම ආසන සංවිධායකවරු සමඟ සාකච්ඡා කොට සියළු සංවිධාන කටයුතු පිළිබඳ ප්‍රගතිය පක්ෂයේ ජාතික සංවිධාක වෙත ඉදිරිපත් කිරීම ඔවුන්ගේ කාර්ය භාර්ය වේ.

**ගරු ආසන සංවිධායකවරු**

14.5.1 තම ආසනයේ කටයුතු ඉතා වගකීමෙන් යුක්තව සංවිධාන කළ යුතු අතර, ශාඛා සමිතිවල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සමඟ පක්ෂය විසින් දෙන සංවිධාන කටයුතු උපදෙස් නිසි අයුරින් තම ආසන වල සංවිධාන කිරීම ඔහුගේ වගකීම හා කාර්ය භාර්ය වේ. ප්‍රාදේශීය නායකයන් හා ශාඛා සමිති සංවිධාන කිරීම ඔහුගේ වගකීම වේ.

**අතුරු ව්‍යවස්ථාව**

**15.5.1 සාමාජිකයන් බඳවා ගැනීම.**

පක්ෂය විසින් නිකුත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පක්ෂ සාමාජිකත්වය ලබා ගත හැක. සාමාජික මුදල වසරකට රුපියල් 100.00 ඇතුළත් වීමේ ගාස්තුවේ රු. 25.00කි. පක්ෂ සාමාජිකත්වය තහවුරු කිරීමට නම් පක්ෂයේ මහ ලේකම්, සභාපති, භාණ්ඩාගාරික විසින් පක්ෂ සාමාජික කාඩ්පත අත්සන් තැබීමෙන් පසුව ඒ නිත්‍යානුකූල පත් වේ.

### 15.5.2 පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීම.

පක්ෂ ව්‍යවස්ථාවට විරුද්ධව කටයුතු කිරීම ප්‍රතිපත්ති හා පක්ෂ නායකත්වට විරුද්ධව කටයුතු කිරීම, විවේචනය කිරීම, වාචිකව, ලිඛිතව, අලිඛිතව, ඇඟවීමෙන් පක්ෂයට කරන ලද අපහස හෝ කුමන්ත්‍රණ කිරීමට පෙළඹුන හොත් විධායක සභාව විසින් ඔහුගේ සාමාජිකත්වය අහෝසි කරන ලැබේ.

### 15.5.3 මූල්‍ය බලතල

මූල්‍ය බලතල ප්‍රධානියා වන්නේ පක්ෂයේ නායකතුමන්ය. පක්ෂයේ චෙක්පත් සඳහා අත්සන් කිරීම තිදෙනෙකුට කළ හැකිය. පක්ෂයේ මහ ලේකම්වරයා ජාතික සංවිධායකවරයා භාණ්ඩාගාරික බැංකු ගිණුම පවත්වාගෙන යායුතුවන්නේ ලංකා බැංකුව විසින්ය.

### 15.5.3 වරප්‍රසාද අහිමි වීම.

යම් කිසි මැතිවරණයකදී අප පක්ෂයෙන් ඉදිරිපත් වූ අපේක්ෂකයින් ඔහු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශිය සභා, නගර සභා මන්ත්‍රීධූරයකට පත් වුවහොත් පසුව ඔහු වෙනත් පක්ෂයකට සම්බන්ධ වුවහොත් ඔහුගේ මන්ත්‍රීධූරය අහෝසි වන්නේය. සෑම අපේක්ෂකයෙක්ම නාම යෝජනා භාර ගැනීමට මත්තෙන් දිවුරුම් ප්‍රකාශයක් මඟින් තමන් පක්ෂය නොහැර යන බවට ප්‍රකාශයක් ලබා දිය යුතුයි.

### 15.5.4 ඇවර කිරීම හා විසුරුවා හැරීම.

පක්ෂය විසුරුවා හැරීමේ බලය ඇත්තේ මහ ලේකම් විසින් පත් කරනු ලබන ස්වාධීන කමිටුවටයි. එම කමිටුවේ සාමාජිකයන් වශයෙන් සභාපති, ජාතික සංවිධායක, භාණ්ඩාගාරික, පළාත් සභාපතිවරු 09 දෙනාට අමතරව, පක්ෂයේ මහ ලේකම් විසින් පත් කරනු ලබන 07 දෙනෙකු ඇතුළත් ව කමිටුව නියෝජනය වේ එකී කමිටුවේ තීන්දුව අවසන් තීන්දුව වේ.

### 15.5.5 මන්ත්‍රීධූර පත් කිරීම.

කේවල මන්ත්‍රී ක්‍රමය හැර සමානුපාතික ක්‍රමය හෝ අනුපාතික ක්‍රමය ක්‍රියාත්මක වන්නේ නම් පක්ෂ ලාංජනයට ඡන්දය දෙන ගණනය කිරීමේ දී එවැනි මන්ත්‍රී සංඛ්‍යාව පත් කරන්නේ මනාප ඡන්ද පදනමට අනුකූලව නොවේ. පක්ෂයේ මහ ලේකම්, ජාතික සංවිධායක, සභාපති යන තිදෙනා පත් කරන ලද ස්වාධීන කමිටුවක් විසින් මන්ත්‍රීධූර සඳහා පුද්ගලයන් නම් කරනු ලැබේ. එයට කිසිදු අභියෝගයක් කිරීමට කිසිදු කෙනෙකුට නොහැකි වන්නේය.